සියලුම හිමිකම් ඇවිරිණි. | රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2017

# 51 - චිත්‍ර කලාව

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

**අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2017**

| විෂයය අංකය பாட இலக்கம் | 51 | විෂයය பாடம் | චිත්‍ර කලාව |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 1 | 21. | 4 | 31. | 2 |
| 02. | 3 | 12. | 3 | 22. | 3 | 32. | 2 |
| 03. | 4 | 13. | 3 | 23. | 1 | 33. | 1 |
| 04. | 2 | 14. | 5 | 24. | 3 | 34. | 3 |
| 05. | 2 | 15. | 3 | 25. | 2 | 35. | 5 |
| 06. | 3 | 16. | 4 | 26. | 4 | 36. | 2 |
| 07. | 2 | 17. | 3 | 27. | 1 | 37. | 4 |
| 08. | 4 | 18. | 4 | 28. | 4 | 38. | 5 |
| 09. | 4 | 19. | 5 | 29. | 2 | 39. | 4 |
| 10. | 5 | 20. | 2 | 30. | 3 | 40. | 5 |

✪ **විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :**

**එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்**

**මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 40 = 40**

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

| | | | |
|---|---|---|---|
| චිත්‍ර කලාව I<br>சித்திரக்கலை I<br>Art I | 51 S I | | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

විභාග අංකය : ........................

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත ය.

**I කොටස**
- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **තිත් ඉර** මත ලියන්න.

**II කොටස**
- අනුකොටස් **තුනකින්** සමන්විත ය.
- **එක්** කොටසකින් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.

* I කොටසට හා II කොටසට අයත් පිළිතුරු පත් එකට අමුණා භාර දෙන්න.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි

| I පත්‍රය සඳහා | |
|---|---|
| කොටස | ලැබූ ලකුණු |
| I | |
| II | |
| එකතුව | |

## I කොටස

● ප්‍රශ්න අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට **වඩාත් යෝග්‍ය පිළිතුර** පහත සඳහන් **A, B, C, D, E** ලෙස නම් කර ඇති කැටයම් ඇතුළත් පින්තූර ඇසුරෙන් තෝරන්න.


A


B


C


D


E

**1.** **A** අක්ෂරයෙන් දැක්වෙන සඳකඩ පහන කැටයම හමුවන්නේ,
(1) යාපහුව දළදා මාළිගයෙනි.
(2) මැදිරිගිරිය වටදාගෙය අසලිනි.
(3) මහනුවර දළදා මාළිගයෙනි.
(4) ලංකාතිලක විහාරයෙනි.
(5) දෙගල්දොරුව රජමහ විහාරයෙනි.
(.........)

**2.** **B** අක්ෂරයෙන් දැක්වෙන කුලුන පිහිටියේ,
(1) පනාවිටිය අම්බලමේ ය.
(2) යාපහුව දළදා මාළිගයේ ආලින්දයේ ය.
(3) ගඩලාදෙණිය විහාරයේ ආලින්දයේ ය.
(4) මහනුවර මගුල් මඩුවේ ය.
(5) ලංකාතිලක විහාරයේ ය.
(.........)

**3.** **C** අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) ග්‍රීකයේ ක්‍රිස්තියානි දේවස්ථානයකි.
(2) ග්‍රීකයේ හමුවන අයොනික් සම්ප්‍රදායේ මැදුරකි.
(3) ග්‍රීකයේ ඇතැන්ස් නුවර ඔලිම්පියා දෙවොලයි.
(4) ඩොරික් කුලුනින් අලංකාර වූ පාතිනන් දෙවොලයි.
(5) සුවිසල් කුලුනු මත ඉදි වූ පැරණි ග්‍රීක දෙවොලකි.
(.........)

**4.** **D** අක්ෂරයෙන් දැක්වෙන කැටයමින් නිරූපණය වනුයේ,
(1) ශිව දෙවියන් පිළිබඳ පුරාවෘත්තයකි.
(2) රාවණා කෛලාසය සොලවද්දී ශිව දෙවියන් එය වළක්වාලන අයුරුයි.
(3) ශිව හා පාර්වති කෛලාසය මත පෙමින් වෙළී සිටින අයුරුයි.
(4) දුර්ගා අසුරයින් පිළිබඳ පුවත ශිව දෙවියන්ට පැවසීමයි.
(5) ශිව හා පාර්වතියගේ විවාහ මංගල්‍යයයි.
(.........)

- ප්‍රශ්න අංක **36** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් නිවැරදි පිළිතුර** පහත සඳහන් චිත්‍රය ඇසුරෙන් තෝරන්න.



**36.** මෙම සිතුවම උපුටා ගන්නා ලද්දේ
(1) දඹුලු ලෙන් විහාරයෙනි.
(2) මැදවෙල ටැම්පිට විහාරයෙනි.
(3) දෙගල්දොරුව විහාරයෙනි.
(4) තෙල්වත්ත විහාරයෙනි.
(5) කතලුව විහාරයෙනි. (.........)

**37.** මෙම සිතුවමට තේමා වී ඇත්තේ
(1) සුතසෝම ජාතකයේ අවස්ථාවකි.
(2) බිලි දීමට රැගෙන යන ළමුන් පිළිබඳ පුවතකි.
(3) ළමුන් බේරා ගැනීමට පැමිණි වෘක්ෂ දෙවියෙකි.
(4) වෙසතුරු ජාතකයේ එක් සිදුවීමකි.
(5) සත්තුභත්ත ජාතකයේ වෘක්ෂ දෙවියායි. (.........)

**38.** මෙම සිතුවම සහිත චිත්‍රාවලියේ කැපීපෙනෙන ලක්ෂණය වනුයේ
(1) හැඩතල නිරූපණයේ ඇති ද්විමාන බවයි.
(2) රේඛා හැසිරවීමේ ඇති ප්‍රාණ පූර්ණ බවයි.
(3) වර්ණ හැසිරවීමේ ඇති ආකර්ශනීය බවයි.
(4) රූප පෙර බිමෙහි රේඛාවක පිහිටා තිබීමයි.
(5) රේඛා, වර්ණ හා හැඩතල රචනයේ ශෛලීගත බවයි. (.........)

**39.** මෙම සිතුවම සංරචනය කිරීමේ දී ශිල්පියා,
(1) චතුරස්‍රාකාර හැඩයට ගැළපෙන පරිදි වස්තූන් යොදාගෙන ඇත.
(2) අඛණ්ඩ කතා ක්‍රමය වෙනුවට එක් සිද්ධියක් නිරූපණය කර ඇත.
(3) තාත්ත්වික නිරූපණයට අවධානය යොමු කර ඇත.
(4) කතා පුවතට යෝග්‍ය පරිදි වස්තූන් හා චරිත මනාව ගළපා ඇත.
(5) පරිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධයකින් යුතුව සම්පිණ්ඩනය කර ඇත. (.........)

**40.** සිත්තරා මෙම සිතුවමින් රසිකයා තුළ ජනිත කරවන හැඟීම වනුයේ
(1) ළමුන් දෙදෙනාගේ හා තමාගේ ආරක්ෂාවට ගත් මානුෂික උපක්‍රමයක් බවයි.
(2) ළමුන්ගේ ආරක්ෂාව පතා ගස් බැඳ තබා ඇති බවයි.
(3) ප්‍රවේශම් සහිතව ගස උඩට නැග ඇති බවයි.
(4) මහල්ලා තුළ ඇති බිය නිසා ගසට නැග ඇති බවයි.
(5) මහල්ලාගේ ආත්මාර්ථකාමී බව හා ළමුන් කෙරෙහි අනුකම්පා විරහිත බවයි. (.........)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

51 S I

## II කොටස

* මෙම කොටස අනුකොටස් **තුනකින්** සමන්විත ය.
* එක් කොටසකින් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.
(අවශ්‍ය තැන්හි පිළිතුරු සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ.)

### 'අ' කොටස

### (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

1. අනුරපුර යුගයේ දී ආවාස ලෙස සැකසුණු ලෙන් පසු කාලයේ දී ශාසනික අවශ්‍යතා සඳහා නවාංග එකතු වීමෙන් ඉතා දියුණු බෞද්ධ ගෘහ නිර්මාණ කලාවක් බවට පත් විය.

   (i) අනුරපුර යුගයේ සංඝාවාස ලෙස සකස් වූ ලෙන් **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි.)

   (ii) ලෙනක් පදනම් කරගෙන, එය ලෙන් විහාරයක් දක්වා වර්ධනය වූ අයුරු උදාහරණ සහිතව පහදන්න. (ලකුණු 06 යි.)

   (iii) බෞද්ධ ගෘහ නිර්මාණ කලාවට එක් වී ඇති සර සංකල්පය හඳුන්වා දී, මින් **දෙකක්** පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 10 යි.)

I.
- වෙස්සගිරිය
- මිහින්තලය
- හිඳගල
- දඹුල්ල
- රිටිගල
- සිතුල්පව්ව
- දිඹුලාගල

II.
- ලෙන තුලට ජලය ගලා ඒම නතර කිරීම සඳහා ලෙන් පියස්ස තුල කටාරම් කෙටීම.
- ඉදිරියේ බිත්තියක් බැඳීම තුලින් ලෙන විහාරයක් ලෙස සැකසීම.
- ඉදිරිපස වහලයක් සකසා අලංකාර පිවිසුමක් සැකසීම.
- ඇතුලත කැටයම්, සිතුවම් හා මූර්තිවලින් අලංකාර කිරීම.
- ආගමික වත් පිළිවෙත් උදෙසා බුද්ධ ප්‍රතිමා මල් ආසන නිර්මාණය කිරීම.
- දඹුල්ල, හිඳගල මෙම යුගය අයත් ලෙන් විහාර ලෙස වැදගත් වීම.

III.
- මිහිඳු හිමියන්ගේ පැමිණීමෙන් පසු භික්ෂු ශාසනය ඇතිවීම.
- භික්ෂු ශාසනය ඇරඹීමෙන් පසු භික්ෂූන්ගේ අවශ්‍යතාවන් උදෙසා විවිධ ගෘහයන්ගේ අවශ්‍යතාව ඇතිවීම.
- ඒ සඳහා මුලින්ම, පිහිටි ගල්ලෙන් භාවිතා කිරීම.
- මිහිඳු හිමියන්ගේ උපදෙස් පරිදි ගෘහයන් නිර්මාණය ඇරඹීම.
- භික්ෂූන් වහන්සේලාගේ දෛනික අවශ්‍යතා සඳහා දාන ශාලා, ආරෝග්‍ය ශාලා, පිරිවෙන් ආදි ගෘහයන් ඉදිවීම.
- ආගමික අවශ්‍යතා උදෙසා චේතියඝර, පටිමාඝර, පධානඝර, බෝධිඝර ආදී ගෘහයන් ඉදි කිරීම.
- ශාසනික අවශ්‍යතා සඳහා ආසනඝර, උපෝසථඝර, පධානඝර ආදිය නිර්මාණය වීම.

- <u>ආසනඝර</u>
  - බුදුන් වහන්සේ වෙනුවට ශෛලමය ආසනයක් සකසා වැඳුම් පිදුම් කිරීම සිදුකර ඇත.
  - එම ආසනය මැදි කොට ඉදිකළ ගෘහය ආසනඝරය වේ.
  - මෙය ධර්ම දේශනා පැවැත්වීමටද යොදා ගැනේ.
  - අනුරාධපුර කැබැතිගොල්ලෑවේ හල්මිල්ලෑව හා මඩකලපුව පුළුකුණාව තුලින් ආසනඝර හමුවේ.

- <u>උපෝසථඝරය</u>
  - භික්ෂූන් වහන්සේලාගේ පොහොය කර්ම, විනය කර්ම ඉටුකිරීම සඳහා ඉදිකළ ගෘහයකි.
  - ලෝවාමහපාය අනුරාධපුර යුගයේ හමුවන උපෝසථඝරයකි.
  - ගල් කනු මත ඉදිකර ඇති මහල් නවයකින් යුතු ගොඩනැගිල්ලකි.
  - 

- <u>පටිමාඝර</u>
  - පිළිමයක ආරක්ෂාව උදෙසා ඉදිකර ඇත.
    මණ්ඩපය, අන්තරාලය, ගර්භ ගෘහය යන වාස්තු විද්‍යාත්මක අංගවලින් සමන්විත වේ.
  - ගර්භ ගෘහය තුල පිළිමය පිහිටා ඇත.
  - චිත්‍ර, මූර්ති, කැටයම් වලින් අලංකාර වේ.
  - නාලන්දා ගෙඩිගෙය, අවුකන පිළිමය අසල නටබුන්, ජේතවනාරාම ස්තූපය අසල පටිමාඝරයේ නටබුන් වැදගත් වේ.

- බෝධිසරය
  - බෝ වෘක්ෂයේ ආරක්ෂාව උදෙමා එහි වටා ඉදිකළ පවුර / බැම්ම බෝධිසරය වේ.
  - මුල් කාලයේ බෝධිසර ගලින්ම ඉදි කිරීම.
  - පසුව කැටයමින් අලංකාර කර තිබීම.
  - චතුරශ්‍රාකාර, ආයත චතුරශ්‍රාකාර හැඩ භාවිත කරමින් මළු කිහිපයකින් ඉදිකිරීම.
  - මුල්ම බෝධිසරය අනුරාධපුර ශ්‍රී මහා බෝධියට ඉදිකිරීම.
  - අලංකාරම බෝධිසරය කිල්ලක් ගමින් හමුවීම.

- චෛතියසරය
  - කුඩා ස්ථූපයක් සඳහා එහි ආරක්ෂාවට ඉදිකළ ගෘහය චෛතියසරය නම් වේ.
  - ස්ථූපයේ මධ්‍ය කේන්ද්‍ර කොටගෙන සිට වූ ගල්කනු පේළි 3ක් හෝ 4ක් මත වහලය ඉදිකර මුදුන ගෝලාකාරව සකසා ඇත.
  - ථූපඝර, වටදාගෙය, ථූපගෘහය ආදි නම් වලින්ද හඳුන්වා ඇත.
  - ථූපාරාමය, කිරියාය ගිරිබණ්ඩ, ලංකාරාමය, මිහින්තලය, අම්බස්තල චෛත්‍ය යන ස්ථාන වැදගත් වේ.

- පධානඝර
  - භාවනානුයෝගී භික්ෂූන් වහන්සේලාගේ අවශ්‍යතාවන් උදෙසා ඉදිකර තිබීම.
  - වේදිකා දෙකකින් යුක්තව ඉදිකිරීම.
  - දිය අගල් සහිතව ඉතා චාම් ලෙස සකසා තිබීම.
  - මුත්‍රා ගල් අලංකාරව කැටයම් කර තිබීම.
  - අනුරාධපුර වට වන්දනා පාර පධානඝරයක් පිහිටා තිබීම.

**2. 18 වැනි සියවසේ කන්ද උඩරට ඇරඹි සිතුවම් කලාව නව මුහුණුවරක් ගත් අතර එය බෞද්ධ බැතිමතුන්ගේ බුද්ධාලම්බන ප්‍රීතිය වඩවාලීමට හේතු විය.**

**(i) මහනුවර යුගයේ සිතුවම් දක්නට ඇති ලෙන් විහාර හතරක් නම් කරන්න.** (ලකුණු 04 යි.)

**(ii) අභිනවයෙන් ඇරඹි මෙම සිතුවම් කලාව පෙර පැවති කලාවෙන් වෙනස් වන අයුරු පහදන්න.** (ලකුණු 06 යි.)

**(iii) "මෙම සිතුවම් සම්ප්‍රදාය පහතරට විහාර කරා පැතිර යාමේ දී වෙනස්කම් රැසකට භාජනය වී ඇත." උදාහරණ සහිතව පහදන්න.** (ලකුණු 10 යි.)

I. දෙගල් දොරුව විහාරය, දඹුල්ල විහාරය, රිදී විහාරය, දනගිරිගල, හිඳගල, මුල්ගිරිගල

II
- මහනුවර යුගයට පෙර පැවති චිත්‍ර කලාව තුළ සම්භාව්‍ය වූ බුද්ධිගෝචර නිර්මාණ බිහි විය.
- අනුරාධපුර යුගයට අයත් සීගිරිය, හිඳගල, පොළොන්නරුව යුගයට අයත් තිවංක පිළිමගෙය උත්තරාරාමය, මහියංගනය, දිඹුලාගල යන ස්ථානවල පවතින චිත්‍ර සම්භාව්‍ය බුද්ධිගෝචර නිර්මාණ විය.
- බුදුදහමේ සිද්ධි ඉතාමත් සරලව අවබෝධකර දිය හැකි අක්ෂිගෝචර වූ චිත්‍ර කලාවක් බිහි කිරීම මහනුවර යුගයේ චිත්‍ර ශිල්පියාගේ මූලික කාර්යභාරය විය.
- මේ අනුව මහනුවර යුගයට අයත් විහාරස්ථාන තුළ මෙවැනි නව කලා සම්ප්‍රදායක් ආරම්භ කිරීම තුළින් පොදු ජනතාව තුළ බොදු හැඟුම් පුබුදුවාලීමට ශිල්පීන් උත්සාහ ගෙන ඇත.
- පෙර පැවති චිත්‍ර කලා සම්ප්‍රදාය තුළ චිත්‍ර නිර්මාණය කිරීමේ දී එක් එක් සිද්ධීන් වෙන් වශයෙන් එක් එක් රාමු තුළ නිර්මාණය කළ ද මහනුවර යුගයේ දී අඛණ්ඩ කථන ක්‍රමයට අනුව චිත්‍රාවලියක් ලෙස චිත්‍ර නිර්මාණය විය.
- මෙතෙක් පැවත ආ සම්ප්‍රදාය තුළ චිත්‍ර නිර්මාණය කිරීමේදී ත්‍රිමාණ ලක්ෂණ භාවිත කළ අතර, මහනුවර යුගයේ දී ද්විමාන ලක්ෂණ භාවිත විය.
- මීට අමතරව චිත්‍රවල පසුබිම සඳහා රතු වර්ණය භාවිත කිරීම, සරල සංකේතමය හැඩ තල භාවිතය, ක්‍රියාකාරීත්වය දැක්වීම අවම වීම, සමාන්තර තීරු අතර චිත්‍ර සම්පිණ්ඩනය වීම, සිද්ධාන්ත භාවිතය අවම වීම, පාර්ශව ගත හා ඍජු දර්ශී හැඩ තල භාවිතය, හැඩතල වටා රතු හෝ කළු වර්ණයෙන් බාහිර රේඛාව යෙදීම මහනුවර යුගයේ චිත්‍රවල දැකිය හැකි වූ විශේෂ ලක්ෂණ විය.

III
- මහනුවර යුගයේ දී කන්ද උඩරට ඇරඹි සිතුවම් කලාව මේ සමයේදීම පහත රට ප්‍රදේශකරා ද ව්‍යාප්ත විය.
- පහත රට චිත්‍රවල මූලික ලක්ෂණ එකක් වූවද ආකෘතියේ සහ ප්‍රකාශනයේ වෙනස්කම් රැසක් ඇති විය.
- කතළුව විහාරය, තෙල්වත්ත විහාරය, මුල්කිරිගල විහාරය, කරගම්පිටිය විහාරය, කැළණිය පැරණි විහාරය, යන ස්ථානවල පහත රට චිත්‍ර නිර්මාණ දැකිය හැකිය.
- කාලීන හා ප්‍රාදේශීය තොරතුරු චිත්‍රවලට එක් වීම තුළින් මෙම චිත්‍රවල මහනුවර කන්ද උඩරට චිත්‍රවලට වඩා යම් යම් වෙනස් කම් ඇති විය.
- කාලයක් විදේශීය ආධිපත්‍යයට යටත්ව තිබූ එම ප්‍රදේශයේ පැවති ජන ජීවිතය පිළිබඳ ශිල්පීන් ලත් අත්දැකීම් ඔවුන්ගේ නිර්මාණවලට එකතු වී ඇත.
- එසේම චිත්‍ර නිර්මාණයේදී වර්ණ භාවිතයේ සහ සිද්ධි නිරූපනයේ දී යම් යම් වෙනස්කම් පොදුවේ දක ගත හැකි විය.

- විහාර බිත්තිය තීරුවලට බෙදාගැනීමේදී තීරු අතර, පරතරය පුළුල් වීමද මෙම චිත්‍ර නිර්මාණවල දකිය හැකි විශේෂ ලක්ෂණයකි.

- විදේශීය ආධිපත්‍යයට යටත්වීම නිසා ලත් අත්දැකීම් මත චිත්‍ර ශිල්පීන් විසින් මෙම යුගයේ චිත්‍රවලට ස්වස්තික ලාංජනය, වික්ටෝරියා රැජින සහ ජෝර්ජ් රජුගේ රුව ඇතුළත් කිරීම විශේෂ ලක්ෂණයකි.

- තවද මානව රූ සඳහා යුරෝපී ඇඳුම් භාවිතය, ගෘහ නිර්මාණ සඳහා බටහිර පන්නයේ ගෘහ නිර්මාණ සංකල්ප භාවිතය , බටහිර පන්නයේ ගෘහ භාණ්ඩ යෙදීම , ඇඳුම් පැළඳුම් සඳහා සැරසිලි බහුලව යෙදීම, බටහිර මල්වර්ග සඳහා බටහිර හැඩතල භාවිතය, නිවාස සඳහා බටහිර ආභාෂය ලත් පහන් භාවිතය දැක්විය හැකිය.

- මහනුවර කන්ද උඩරට සිතුවම්වල පසුබිම තුළ යෙදූ ගස් හා මල් වර්ග සිංහල සැරසිලි ආභාෂය ගත් අතර, පහත රට චිත්‍රවල ගස්, මල්, යෙදීමේ දී විදේශීය ආභාෂය ගෙන ඇත.

- මෙම යුගයේදී ඇතිවූ පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි බලපෑමත් මුස්ලිම් ජාතික බලපෑමත් නිසා ඇඳුම් නිර්මාණවල වෙනස්කම් ඇතිවූ අතර, කාන්තාවන් සඳහා මොට්ටපිපිලි යෙදීම ඒ අනුව සිදුවී ඇත. එසේම ඉංග්‍රීසි ජාතික බලපෑම නිසා මානව රූපවල හිසට ඔටුනු යෙදීම කර ඇත.

- තවද පහත රට පැවති බලි ශාන්ති කර්මවල ආභාෂය අනුව විහාර වියන් සිත්තම් සඳහා රාශි චක්‍රය සහ නවග්‍රහයින් ඇතුළත් කර ඇත. කන්ද උඩරට චිත්‍රවල වියන් සිත්තම්වල භාවිත කර තිබුනේ නෙලුම් මල් මෝස්තරයන්ය.

- තවද පහත රට චිත්‍රවල මානව රූ සහ සත්ව රූපවල ත්‍රිමාන ලක්ෂණ යම් තරමකට දැක්වීම ද විශේෂ ලක්ෂණයකි.

- කන්ද උඩරට චිත්‍රවලට වඩා පහත රට චිත්‍රවල පසුබිම පිරී යන සේ මිනිස් රූප, සත්ව රූප සහ ගස්වැල් යෙදීම දකිය හැකිවිය. ඇතැම් විට නොවැදගත් දේ පවා චිත්‍රයට ඇතුළත් කර තිබුනි. පසුබිම සඳහා කළු වර්ණය යෙදීම ද විශේෂ ලක්ෂණය.

- උඩරට සම්ප්‍රදායේ චිත්‍රවල දකිය නොහැකි වූ සෝරෙයිය සිටානන්ගේ කථා වස්තුව, තේලපත්ත ජාතකය, පටාචාර කථා පුවත යන චිත්‍ර ද මෙම පහත රට චිත්‍ර අතර ඇද තිබීම විශේෂ ලක්ෂණයකි.

**'ආ' කොටස**

**(චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)**

**3.** ජාතක කතා, බුද්ධ චරිත හා ඓතිහාසික පුවත් තේමා කර ගනිමින් සියවස් ගණනක් පුරා සංරචිත සිතුවම් රැසක් අජන්තා සිතුවම් අතර වේ.

(i) අජන්තා සිතුවම් අතර නිර්මිත ජාතක කතා **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) අංක 17 ගුහාව තුළ දක්නට ඇති 'සිංහලාවදානය' සිතුවමෙහි අන්තර්ගතය හා ආකෘතිය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි.)

(iii) "අජන්තාවේ අවසන් භාගයේ මහායාන ආභාසය මත නිම වූ සිතුවම් එහි ඇති උසස් ම නිර්මාණ ලෙස ඇගයීමට ලක්ව ඇත." උදාහරණ සහිතව පහදන්න. (ලකුණු 10 යි.)

I.
- සාම ජාතකය
- ඡද්දන්ත ජාතකය
- විදුර ජාතකය
- මහා හංස ජාතකය
- මහා ජනක ජාතකය
- චම්පෙය්‍ය ජාතකය
- ස්වර්ණ හංස ජාතකය
- මාතුපෝසක ජාතකය

II.
- අජන්තාවේ 17 වන ගුහාවේ හමුවන සිංහලාවදානය සිතුවම ශ්‍රී ලංකාවට වැදගත්වන ඓතිහාසික පුවතක් නිරූපණය කරන්නකි.
- විජය කුමරු ශ්‍රී ලංකාවට පැමිණීම මින් නිරූපණය කෙරේ.
- මෙම සිද්ධිය හා සම්බන්ධ අවස්ථා කීපයක් නිරූපනය කිරීමට වෙහෙසී ඇත.
- විජය කුමරු සපිරිවරින් නැව් මගින් පැමිණ ලක්බිමට ගොඩබසින අයුරු යක්ෂ ගෝත්‍රිකයන් සමග සටන් සහ රාජාභිෂේකය යන අවස්ථා අඛණ්ඩ කථික මාධ්‍යයෙන් දක්වා ඇත.
- එකම සිතුවමක් තුල අවස්ථා කීපයක් එකට සම්පිණ්ඩනය කිරීමේ හැකියාව මින් නිරූපණය කෙරෙයි.
- සිව්රඟ සෙනග නැවින් ගොඩ බසින අයුරු දක්වන අවස්ථාවේ ඇත් සේනාව විසිතුරු ලෙස දක්වා ඇත.
- යක්ෂයින් සමග කරන සටනේදී යක්ෂයින් අද්භූත බල සහිත පිරිසක් ලෙස අහසේ සිට සටන් කරන අයුරු දක්වයි.
- අභිෂේකය දක්වන අවස්ථාව සිතුවමේ වැදගත්ම අවස්ථාවයි. එහි කුවේනිය හා විජය කුමරුට ප්‍රධාන තැනක් හිමිවේ.
- මෙය ඉතා සුවිසල් සිතුවමක් වන අතර එහි මනා සම්පිණ්ඩනය අජන්තා සිත්තරුන්ගේ නිර්මාණශීලී හැකියාව දැක්වීමට සමත්ව ඇත.

III. අජන්තාවේ පසුකාලීන සිතුවම් උසස් කෘතීන් ලෙස ඇගයීමට හේතු

- අජන්තාවේ අංක 1, 2, 16 සහ 17 ලෙන්වල සිතුවම් මෙකී පසුකාලයට අයත්වේ.

1. සිතුවම් කලාවේ දියුණුව ඃ-

- මුල් කාලයේ සිතුවම් පටු තීරු වශයෙන් නිරූපණය වීම.
- ඒවා සරල බවින් හා විසිතුරු බවින් අඩුවීම.
- පසුකාලීන සිතුවම් බිත්තිය පුරා, විවිධ හැඩතල මතුවන සේ රචනය වීම.
- විශාල ප්‍රදේශයක මානව රූප ප්‍රමාණයෙන් විශාලව ඇඳීම තුළින් ප්‍රකාශනාත්මකබව වැඩිවීම.
- මානව රූපයේ ලාලිත්‍යය, විස්තරාත්මක නිරූපණය තහවුරුවීමත් භාව ප්‍රකාශන මනාව පිළිබිඹු වීම.

2. ශිල්පීන් පරිනතියට පත්වීම ඃ-

- මේ යුගය වනවිට ශිල්පීන් ලබා තිබූ පරිණතිය
- චිත්‍ර කලාවේ පිළිගත් සිද්ධාන්තයන් ඇතුළත් "ෂඩංග " පිළිබඳ ලබා තිබූ දැනුම.
- භාව ප්‍රකාශනය කෙරෙහි අවධානය යොමුවීම.

3. ගුප්ත කලාවේ ආභාෂය ඃ-

- ගුප්ත රජවරුන්ගේ රාජ අනුග්‍රහය ලැබීම.
- ගුප්ත කලා කෘතීන්හි (මූර්ති) ඇති කලා ලක්ෂණ අජන්තාවේ සිත්තම්වූ මානව රූප තුළින් පිළිබිඹු වීම.
- භාව ප්‍රකාශනය කෙරෙහි අවධානය යොමුවීම.

4. මහායාන ආභාෂය ඃ-

- බෝධි සත්ව සංකල්ප පිළිබිඹුවන තේමා සිතුවම් වීම.
  (උදාඃ- අංක 1 ලෙන - පද්මපාණී / අවලෝකිතේස්වර බෝසත්)
- මහායාන සංකල්ප ඇතුළත් "ලලිත විස්තරයෙ " එන කථාවස්තූන් සිතුවම් වීම.
  (උදා ඃ- 16 ලෙන - නන්ද කුමරු පැවිදිවීම කථාවේ එන "මරණාසන්න කුමරිය" චිත්‍රය
- ෂද්දන්ත ජාතකය නිරූපණය

5. භාව ප්‍රකාශනය ඃ-

- සිද්ධි නිරූපණයේදී මානව රූපයේ හැසිරවීම තුළින් මතුකරවන හැඟීම් ප්‍රකාශනය.
- බෝධිසත්ව රූ තුළින් නිරූපිත අධ්‍යාත්මික ලක්ෂණ
- මරණාසන්න කුමරියගේ අවසන් අවස්ථාව නිරූපණය
  (16 ලෙන - එම රූපවල ඉරියව්, මුද්‍රා හා සංකේත (මොනරා) තුළින් මතුකරවන හැඟීම්
- ස්වාභාවික පරිසරයේ සුන්දරත්වය නිරූපණය වීම. (උදා ඃ- ෂද්දන්ත ජාතකය)

**4.** **වාස්තු විද්‍යාව හා මූර්ති කලාව අතින් විශේෂ දක්ෂතා දැක්වූ පල්ලව පාලන සමය බිඳවැටීමෙන් අනතුරුව දකුණු ඉන්දියාවේ ආධිපත්‍යයට පත් චෝල පාලන සමය ද එලෙස ම එකී කලාවන්ගෙන් දස්කම් පෑමට සමත් විය.**

(i) **චෝල ශිල්පීන් විසින් නිර්මිත ආගමික මූර්ති හතරක් නම් කරන්න.** (ලකුණු 04 යි.)

(ii) **රාජරාජගේ නිර්මාණයක් වූ 'රාජරාජේශ්වර' දෙවොලේ වාස්තු විද්‍යා ලක්ෂණ සැකෙවින් විමසන්න.** (ලකුණු 06 යි.)

(iii) **පල්ලව කලාකරුවන්ගේ නිර්මාණයක් වන 'පංච පාණ්ඩව රථ' දේවාල නම් කර, ඒවායේ මාධ්‍ය භාවිත කර ඇති අයුරු හා භාවිත ශිල්ප ක්‍රම පිළිබඳව පහදන්න.** (ලකුණු 10 යි.)

I.
- බ්‍රාහ්මණී රූව
- දක්ෂිණ මූර්ති
- විෂ්ණු ප්‍රතිමාව
- පාර්වතී ප්‍රතිමාව
- වීනාධර ප්‍රතිමාව
- නටරාජා ප්‍රතිමාව

II. <u>රාජ රාජේශ්වරි දෙවොල</u>

- දකුණු ඉන්දියාවේ තංජෝරයේ ඉදිවූ රාජ රාජේශ්වර දේවාලය මේ යුගයේ ඉදිවූ සුවිශේෂ නිර්මාණයකි.
- දිගින් අඩි 180ක් වූ දෙවොලේ ශිඛරය සහිතව ප්‍රධාන මන්දිරය අඩි 82ක් වූ සමචතුරස්‍රාකාර වනසේ තනා ඇත.
- මෙහි ශිඛරයේ උස අඩි 190කි. ශිඛරය මුදුනේ වෘත්තාකාර හැඩය ගත් ශිලාමය ශීර්ෂයක් වේ. එය ටොන් 80ක් පමණ බර වූ අතර එය දරා සිටීම සඳහා පොළොවේ සිට මුදුන දක්වා යුප කණුවක් යොදා ඇත.
- දෙවොලට පිවිසෙන මාර්ගය ඉදිරිපස විශාල නන්දි මූර්තියකි.
- මන්දිරයට ඇතුළුවූ තැන කුළුණු සහිත ආලින්දයකි. ඉන් ඔබ්බට ගිය තැන සභා ශාලාවකි. දෙවොලේ පහත මාලයේ බාහිර බිත්තිවල කුළුණු සහිත විමානාකාර හැඩ යොදා ඇත.
- ඉහල පිරමිඩාකාර කොටස සියුම් කැටයම් හා බොරදම් යොදා ඇති අයුරු විසිතුරුය.
- බොරදම් තීරු අතර යොදා ඇති සැරසිලි හැඩ ගෝපුර කැටයම් සිහිපත් කරවයි.

III.
- ද්‍රාවුපදි රාත්
- අර්ජුන රාත්
- භීමා රාත්
- ධර්මරාජ රාත්
- සහදේව රාත් යන නම්වලින් පංච පාණ්ඩව රථ දෙවොල හැඳින්වේ.
- <u>ද්‍රාවුපදි රාත් දෙවොල</u> ඉතා කුඩා මෙන්ම විසිතුරු බවින් ද අඩුය.
- හතරැස් ගර්භය මත පල හතරකට වහලය සකසා ඇත. මෙය සාමාන්‍ය නිවසක හැඩය ගනී.

- අර්ජුන රාත් දෙවොලද චතුරශ්‍රකාරය වහලය පිරමීඩාකාරව උසට තනා ඇත. එය තට්ටු තුනකින් යුක්ත වන අතර මුදුනේ ශඩශ්‍රාකාර වක්‍ර ශිඛරයකි.

- භීමාරාත් දෙවොල ප්‍රමාණයෙන් විශාලය. දිගින් වැඩිය වහලය දිගැටි බැරලයක අයුරුවක් ගනී. දෙකෙළවර චෛත්‍ය කවාටයක ආකාරය ගනී.

- ධර්මරාජ රාත් දෙවොල ද චතුරස්‍රාකාරය. එහි වහලය උස්වූ පිරමීඩ ආකාරයක් ගනී. එය කොටස් තුනකින් යුක්ත වේ. එහි මුදුනේ කවාකාර ශිඛරයකි.

- සහදේව රාත් වෙනම මලකින් ඉදිකරන ලද්දකි. මෙය හැඩයෙන් වෙනස්ය. මාලක දෙකකින් යුක්තය.

- ඉංග්‍රීසි යූ අකුරක හැඩය ගත් මෙය පිටුපස හැරී සිටින ඇතෙකුගේ ලක්‍ෂණ සිහිපත් කරයි.
- මෙය ඉදිරියේ විශාල ඇත් රුවක් නෙලා ඇත. ජීව ප්‍රමාණයේ සිංහ හා ගව රූපය මේ අතර දක්නට ලැබේ.

- කලුගලින් කපා නිමකරන ලද මෙම දෙවොල සංකීර්ණය ගෘහ නිර්මාණය අතින් වැදගත් වේ.

- මේ සැම දෙවොලකම බොරදම් සහිත බාහිර බිත්තිවල කුළුණු හැඩවලින් යුතු විමාණාකාර හැඩ දක්නට ලැබේ.

- මේවා තුල පාණ්ඩව ලක්‍ෂණ පිළිබිඹු කරවන මූර්ති යොදා තිබේ.

**'ඉ' කොටස**

**(චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)**

**5.** **නයිල් ගංගාධාරය පදනම් කොට ගෙන සියවස් ගණනක් පුරා පැවති මිසර ශිෂ්ටාචාරය කලා නිර්මාණ රැසක් ලොවට දායාද කළ දීර්ඝතම ශිෂ්ටාචාරයයි.**

(i) **සාම්ප්‍රදායික ලක්ෂණ පිළිබිඹු කරන පැරණි මිසර මූර්ති දෙකක් නම් කරන්න.** (ලකුණු 04 යි.)

(ii) **අබුසිම්බල් දෙවොල නිර්මාණයේ දී යොදාගත් ශිල්පක්‍රම හඳුන්වා, එහි එදා සහ අද තත්ත්වය සැකෙවින් පහදන්න.** (ලකුණු 06 යි.)

(iii) **පැරණි මිසර සොහොන් ගෙවල් හා දේවස්ථාන සැරසීමට චිත්‍ර හා කැටයම් යොදා ගත් අයුරු හා ඒවායේ කලා ලක්ෂණ පිළිබඳ විමසීමක් කරන්න.** (ලකුණු 10 යි.)

I.
- ස්පින්ක්ස්
- රහෝටෙප් සහ නෝෆ්‍රෙට්
- රමෙසස් /රැම්සෙස්
- ඇමොන් හිරු දෙවියන්
- කාෆ්රේ
- රැනොෆා
- මෙන්කවුරේ

II.

- නයිල් ගංගාධාරයේ දකුණු පෙදෙසේ අස්වාන් ප්‍රදේශයට දකුණු දෙසින් හමුවේ.
- දෙවන රැම්සෙස් රජ විසින් ස්වාභාවික ගල් පර්වතයක් හාරා සකස් කරන ලද්දකි.
- පර්වතයේ හැඩයට උචිත වන අයුරින් හා පාරිසරික තත්ත්වයන්ට ගැලපෙන අයුරින් ඇතුල්වන දොරටුව සමීපයේ පර්වතය ලම්බකව කපා නිමකර ඇත.
- දිගින් අඩි 80ක් හා පළලින් අඩි 124 කි.
- දේවස්ථානයේ ඇතුලත හා පිටත මූර්ති හා කැටයම් පර්වතය හැරීමෙන් මතුකර ඇත.
- ඉදිරිපස දොරටුව දෙපස ඇති අඩි 66ක් උස රැම්සෙස් රූප නිර්මාණයේ දීද පර්වතයේ ස්වාභාවික හැඩයට හානියක් නොවන අයුරින් සකස් කර ඇත.

එහි එදා සහ අද තත්වය ඃ-

- ඊජිප්තු රජය ගත් තීරණය අනුව නයිල් නදිය හරහා ඉදිකරන ලද අස්වාන් වේල්ල නිසා ජලයෙන් යටවුන අබුසිම්බල් දෙවොල වෙනත් උස් ස්ථානයක ස්ථාපනය කර ඇත.
- 1968 දී නූතන තාක්ෂණය උපයෝගීකර ගනිමින් අස්වාන් වේල්ලට වඩා ඉහලින් කෘත්‍රිම සකසන ලද කඳු ගැටයක් මත මෙය යුනෙස්කෝ සංවිධානය ඉදිරිපත්වීමෙන් නැවත ස්ථාපනය කොට ඇත.
- මුල් නිර්මාණයට කිසිඳු හානියක් නොවන අයුරින් මෙය නැවතී එලෙසින්ම පිහිටුවා ඇත.
- අතීත උරුමයන් රැකීමත් අනාගතය සමෘද්ධිමත් කිරීමත් යන කරුණු දෙකම රැකගැනීම වෙනුවෙන් ලෝක මතයක් ගොඩ නැගීම.
- ලෝක උරුමයක් වූ කලා නිර්මාණයක් මතු පරපුර වෙනුවෙන් ආරක්ෂා කර තැබීම යහපත් කාර්යයකි.

III.

- මළවුන් වෙනුවෙන් කෙරෙන මායාහුරු ආගමික සංකල්පයක් මත සොහොන් ගෙවල් සැරසිලි කළ බව.
- මේ සඳහා චිත්‍ර, මූර්ති හා කැටයම් යොදා ගැනීම.
- සොහොන් ගෙවල බිත්ති පාරාවරුන්ගේ දෛනික ජීවන තොරතුරු නිරූපිත රූපාවලි මගින් සැරසීම.
- මළගිය පාරාවරුන්ගේ ආත්මය සොහොන් ගෙය තුළට පැමිණ පූජාවන් බාරගැනීමට හැකිවේය යන අදහසින් ඒවා ඇඳ තැබීම.
  (උදා ඃ-නක්ත් පාරවන්ගේ සොහොන් ගෙයි ඇඳ ඇති පූජා භාණ්ඩ )
- දෙවිවරුන්ට පූජාවන් පවත්වන ආකාරය නිරූපණය වීම.

- මළගිය ආත්මයට පැමිණ වින්දන අත්දැකීම් ලබාගැනීමට හැකිය යන අදහස මත සිද්ධි නිරූපණය කිරීම.
  (උදා :-ටයි පාරාවන් හිපපොටේමස් දඩයම නැරඹීම.)
- සිතුවමින් බිත්ති පමණක් නොව විවිධ භාණ්ඩ ආදිය සැරසීම.
  (උදා :- ටුටන්කාමන්ගේ දඩයම් දර්ශනය - පෙට්ටගමක ඇති චිත්‍රය)
- කැටයම් මාධ්‍යය යොදාගෙන බිත්ති සැරසීම.
- මේවා අල්පෝන්නතව ඉතා සියුම් ලෙසද විස්තරාත්මකවද කර තිබීම.
- බිත්තියක් පිරියනසේ කැටයම් කිරීම මෙන්ම ඒ වටා පටු පනේල යොදා සැරසීම.
- කැටයම් කළ සමහර දර්ශන වර්ණවත් කිරීම.
  (උදා :- හිපපොටේමස් දඩයම / දිය පාරක යන ගවයින් හා ගවපල්ලන් )
- චිත්‍ර කලාවේදී මෙන්ම කැටයම් කලාවේදීද සම්ප්‍රදායික ලක්ෂණ හා ස්වාභාවික ලක්ෂණ නිරූපණය වීම.
- මීට අමතරව මූර්ති වශයෙන් - පාරාවන්ගේ පිළිරුව, ලියන්නා, දේව රූප ආදියද සොහොන් ගෙවල් ඇතුළත තැබීම.
- පිරමීඩ තුළ යුධ දර්ශන, දඩයම් දර්ශන හා විවිධ කර්මාන්තයන්හී යෙදෙන්නන්ගේ සිද්ධි ද දේවස්ථානය තුළ පාරාවන්ගේ ජීවන තොරතුරු ද ඇඳ ඇත.

- <u>චිත්‍රවල ලක්ෂණ</u>
  - සමාන්තර රේඛා මත තිරස්ව විහිදී යන අයුරින් ඇඳ ඇත.
  - ශෛලිගත බව හා අර්ධ තාත්වික බව.
  - චිත්‍රමය සිද්ධාන්ත සලකා නොමැත.
  - චිත්‍රයේම කොටසක් ලෙස හයිරොග්ලිෆික්ස් අක්ෂර (රූපාක්ෂර) යොදා ඇත.
  - රටාමය ආකෘතියෙන් හා සැරසිලි බවින් යුක්තය.
  - පාර්ශවදර්ශී රූප බහුලය.
  - පාර්ශවදර්ශී මුහුණට සෘජු දර්ශී ඇස් යෙදීමෙන් දැඩි අවධානයකින් සිටින බව පෙන්වීමට උත්සාහ දරා ඇත.
  - භාණ්ඩ, ස්වාභාවික පරිසරය හා මානව රූප සාම්ප්‍රදායික ලක්ෂණවලින්ද සත්ව රූප ස්වාභාවික ලක්ෂණ ලෙස ද නිර්මාණය කර ඇත.
  - වර්ණ යෙදීමේ දී-
    - සීමිත වර්ණ හා පැතලි වර්ණ (ද්විමාන) භාවිතය
  - වංශාධිපතිවරුන් , දෙවිවරුන්, පාරාවරුන් සඳහා කහ වැනි දීප්තිමත් වර්ණයද සෙසු චරිත සඳහා ඊට උචිත වර්ණයන් ද යොදා ඇත.
  - රූප වටා සියුම් බාහිර රේඛා යෙදීම.

**6.** **ග්‍රීක කලාවේ ආභාසය ලැබූ රෝම ශිල්පීන් පසුව ග්‍රීකයින් අභිබවා යමින් වාස්තු විද්‍යාව හා මූර්ති කලාව අතින් අතිදක්ෂයෝ වූහ.**

**(i) රෝම ශිල්පීන් විසින් නිර්මිත වාස්තු විද්‍යා නිර්මාණ හතරක් නම් කරන්න.** (ලකුණු 04 යි.)

**(ii) ඉහත (i) ට අදාළ ව ඔබ සඳහන් කළ ඒවායින් එකක නිර්මාණ ආකෘතිය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.** (ලකුණු 06 යි.)

**(iii) රෝම උඩුකය මූර්ති දෙකක් හඳුන්වා, ඒවා උසස් නිර්මාණ ලෙස ඇගයීමට ලක්වීමට හේතු දක්වන්න.** (ලකුණු 10 යි.)

I. • කොලෝසියම (වටමණ්ඩල - ඇම්පිතියටර්) - පැන්තියන් - ස්නානාගාර - ෆෝරම් - බැසිලිකා - විජයග්‍රහණ කුළුණු - විජයග්‍රහණ ආරුක්කු - (ට්‍රැජන්, ටයිටස්, කොන්ස්ටන්ටයින් - සෙප්ටිමස්)

II. <u>කොලෝසියම - (ඇම්පිතියටර් - වට මණ්ඩල)</u>

එළිමහන් පොරපිටියක් වටා ගොඩනැගූ ක්‍රීඩා මන්ඩපයකි - හැඩයෙන් ඕවාලාකාරය - දහස් ගණනකට ආසන පහසුකම් ඇත - පියස්සක් නොමැත - දිගින් අඩි 620කි - පළල අඩි 500 පමණ වේ. පිට බිත්තිය මහල් හතරකින් යුක්තය - එය ආරුක්කු සහිතය - ඩොරික්, අයොනික්, කොරින්තියන් කුළුණු බිත්තියට සම්බන්ධය. පිට බිත්තියේ සිට පොරපිටිය දක්වා බෑවුම් වන සේ ආසන සකසා ඇත - ආසන පේළි අතරින් පියගැට පේළි ද ඒවා යටින් ගමන් පථ සකසා ඇත - පොසොලානා සිමෙන්ති, කොන්ක්‍රීට්, ට්‍රැවටීන් ගල් කිරිගරුඬ පුවරු භාවිතා විය.

<u>පැන්තියන්</u>

ආගමික ගොඩනැගිල්ලකි. රෝම වෘත්තාකාර ගොඩනැගිල්ලක් හා ග්‍රීක පෝටිකාවක් සම්බන්ධ කර නිර්මිතය. පුළුල් බිත්ති සහිත වටකුරු ගොඩනැගිල්ල මත යන්තමින් ගෝලාකාර වූ පියස්සකි. කොන්ක්‍රීට් වළලුවල ආධාරයෙන් පියස්ස නිමවා ඇත - පියස්ස මුදුනේ අඩි 20 විශ්කම්භයෙන් යුත් වටකුරු කවුළුවකි. ඇතුළතට ආලෝකය එයින් ලැබේ. ඇතුළත කුළුණු හෝ බිත්ති නැත. ඩොරික් කුළුණු සහිත ග්‍රීක පෝටිකෝව, දෙපසට වැහුම් වන පියස්සකින් යුක්තය - ප්‍රධාන හා එකම දොර පෝටිකෝව පැත්තෙන් වේ. ඇතුළත බිත්ති කිරිගරුඬ පුවරු අල්ලා ඇත - පියස්සේ ඇතුළත කොටු රටාවලින් යුක්තය - මුලදී ඒවා ලෝකඩ සැරසිලිවලින් අලංකාර විය. දෙවිවරු හත්දෙනෙකු වෙනුවෙන් කැප කළ දේවස්ථානයකි.

<u>විජයග්‍රහණ ආරුක්කු</u>

රෝම අධිරාජ්‍යයන්ගේ යුධ ජයග්‍රහණ සැමරීම සඳහා නිර්මාණය වන ආරක්ෂාවී ඇති ආරුක්කු අතර, ට්‍රැජන් , ටයිටස්, සෙප්ටිමස් හා කොන්ස්ටන්ටයින් ආරුක්කු ආරක්ෂා වී ඇත. යටින් යා හැකි පරිදි දොරටු සහිතව පාරවල් හරහා ගොඩනගා ඇත. කොන්ස්ටන්ටයින් මේවා අතර ඇති සංකීර්ණ නිර්මාණයකි. ගල්, බදාම, කිරිගරුඬගල් පුවරු භාවිතයට ගෙන ඇත. කෙටි කුළුණු මත ඉදිවූ කොරින්තියන් කුළුණු 8කි. හතරැස් හා වෘත්තාකාර ජනේල තුළ යුධ පිළිබඳ විවිධ සිද්ධීන් කැටයම් කර ඇත. ආරුක්කුව මුදුනේ ලෝකඩ අශ්ව කරත්තයක් හා ඒ මත අධිරාජ්‍යයාගේ පිළිරුවක් තිබූ බව පැවසේ.

## 111. පත්‍රය -''ආ'' මෝස්තර හා සැරසිලි නිර්මාණය

අභිමතාර්ථ - දෛනික ජීවිතයේ ඇතිවන විවිධ අවශ්‍යතාවන්ට හා සන්නිවේදන ක්‍රියාවලියට සරිලන පරිදි නිර්මාණශීලී සැලසුම්කරණය හා අලංකරණය පිළිබඳ අපේක්ෂකයා ලබා ඇති කුසලතා පිරික්සීම

111. වැනි ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී සැහෙන අපේක්ෂක සංඛ්‍යාවක් ''ආ'' කොටස තෝරාගන්නා බව පෙනේ. මොවුන් අතුරින් වැඩි දෙනෙක් සිද්ධාන්තමය අවබෝධයකින් යුතුව නවතාවකින් යුතු මෝස්තර නිර්මාණයේ යෙදෙන අතර අනවබෝධයෙන් මෝස්තර නිර්මාණය කිරීමට වෙහෙසෙන අයද බෙහෝ ය. කෙසේ වෙතත් අපේක්ෂකයන්ගේ නිර්මාණ තුළින් පිළිබිඹු වන්නේ ඔවුන් අත්පත් කරගෙන ඇති හැකියා හා කුසලතා වන්ගේ පරිමාණයයි. නිර්ණායකයන් ඔස්සේ ඔවුන් දක්වා ඇති කුසලතාවන්ගේ ප්‍රමාණයන් තේරුම් ගෙන ලකුණු ප්‍රදානය කිරීම කළ යුතු වේ.

ලකුණු දීමේ නිර්ණායක

| | | |
|---|---|---|
| 1 - මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් නවතාවකින් යුතුව සැලසුම් කිරීමේ හැකියාව | - ලකුණු | 20 |
| 2 - පාරිභාරික අවශ්‍යතාවන්ට ගැලපෙන බව හා කර්මාන්තයට උචිත බව | - ලකුණු | 20 |
| 3 - රේඛා හැඩතල අර්ථවත්ව යොදාගැනීමේ හැකියාව | - ලකුණු | 20 |
| 4 - උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ කුසලතාව | - ලකුණු | 20 |
| 5 - විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය | - ලකුණු | 20 |
| ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | - ලකුණු | 100 |

## 111. පත්‍රය -''ඉ'' ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය

අභිමතාර්ථ - වාණිජ අවශ්‍යතාවන්ට හා සන්නිවේදන ක්‍රියාවලියට සරිලන පරිදි නිර්මාණශීලී සැලසුම්කරණය හා අලංකරණය පිළිබඳ අපේක්ෂකයා ලබා ඇති කුසලතා පිරික්සීම

ලකුණු දීමේ නිර්ණායක

| | | |
|---|---|---|
| 1 - මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් නවතාවකින් යුතුව සැලසුම් කිරීමේ හැකියාව | - ලකුණු | 20 |
| 2 - වාණිජමය හා සන්නිවේදන අවශ්‍යතාවන්ට ගැලපෙන බව හා කර්මාන්තයට උචිත බව | - ලකුණු | 20 |
| 3 - රේඛා හැඩතල අර්ථවත්ව යොදාගැනීමේ හැකියාව | - ලකුණු | 20 |
| 4 - උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ කුසලතාව | - ලකුණු | 20 |
| 5 - විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය | - ලකුණු | 20 |
| ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | - ලකුණු | 100 |

සටහන් ..........................